# ජාවා රටේ බෞද්ධ කලා ශිල්ප

පණ්ඩිත හිස්සැල්ලේ, ධම්මරතන (බී. ඒ.) හිමියන් විසිනි

බුද්ධකාලයෙහි පටන් 'ථෙරවාදය' නමින් හඳුන්වනු ලැබූ එකම බුද්ධාගම ක්‍රිස්තු වර්ෂාරම්භයේදී හීනයාන–මහායාන වශයෙන් කොටස් දෙකකට බෙදී ගියේය. එයින් මහායාන බුද්ධාගම නොබෝ කලකින්ම ඉන්දියාවෙහි පමණක් නොව ජාවා, සුමාත්‍රා ඉන්දුනීෂියා ආදි රටවලත්, චීන, ජපන්, කොරියා, ටිබෙට් ආදි ඈත පෙර දිග රටවලත් ව්‍යාප්තවී ගියේය. ක්‍රි:ව: 2 වෙනි සියවසේ ලියැවුණු ද්‍රවිඩ බෞද්ධ මහා කාව්‍යයක් වූ මණිමෙබලාවෙහි ද එකල ජාවා රටේ බුද්ධාගම ප්‍රබලව පැවති බව සඳහන්වේ. ක්‍රි:ව: 4 වෙනි සියවසෙහි පමණ ජාවා රටට ගිය ෆාහියන් නැමති චීන භික්ෂුවත්, ඊට පසු ඒ රටට පැමිණි ඉට්සං නැමති චීන භික්ෂුවත් ඒ කාලවල ජාවා රටෙහි බුද්ධාගම පැවති අයුරු විස්තර කරත්. ක්‍රිස්තුවර්ෂාරම්භයේදී ම ජාවා රට බෞද්ධ රටක් වූ බව මේ කරුණුවලින් පැහැදිලිවේ. මෙසේ බෞද්ධරටක් වූ ජාවාරටෙහි මුල් කාලයේ පටන් ඇති වූ බෞද්ධ කලාශිල්පයන් පිළිබඳ විස්තරයක් දක්වීම මෙහි අදහස වේ.

බුද්ධාගමේ ජන්ම භූමිය වූ ඉන්දියාවෙහි අති විශාල බෞද්ධ ස්මාරකයන් නොමැතිවීම පුදුමයට හේතුවකි. එහෙත් පසු කාලයෙහි බුද්ධාගම පිහිටවනු ලැබූ ජාවා රටෙහි විෂ්මයජනක අති විශාල බෞද්ධ ස්මාරකයන් ඇති බව ප්‍රකටය. චීන වන්දනාකරුවෙකු වූ ෆාහියන් භික්ෂුව ක්‍රි:ව: 400 පමණේදී ලක්දිව සිට පෙරලා චීන දේශයට යන ගමනේදී ජාවා රටට ද පැමිණියේය. එකල බෞද්ධ භක්තිකයන් ගණනින් අඩුව සිටිබවත්, මිථ්‍යාදෘෂ්ටිකයන් අධිකව සිටි බවත්, එයට හේතුව බ්‍රහ්මාගම බලයට පැමිණ තිබීමත් යයි ඔහු තමාගේ ගමන් විස්තරයෙහි සඳහන් කරයි. ෆාහියන් ගේ මේ කියමන ශිලාලෙඛනවලින් ද ඔප්පුවේ. මලයා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ජාවා රටෙහි තිබී සොයාගන්නා ලද ආදිම ශිලාලෙඛනය බ්‍රහ්මාගමට අයත්ය. ජාවා රටෙහි තිබී පළමුවෙනි වරට සොයාගත් බෞද්ධ ශිලාලෙඛනය ක්‍රි:ව: 778 අයත්ය. මේ ශිලාලෙඛනය මධ්‍යම ජාවාරටේ කලසන් නැමති ගමේ තිබී සොයාගන්නා ලදී. බොහෝ කරුණු අතින් මෙය ඉතා වැදගත් බව පුරාවිද්‍යාඥයෝ කියති. එහි පන්සලක් සෑදීම ගැනත් එය තාරාදේවියට හා විනයපිටකය–මහා යාන බුද්ධාගම යන දෙක දන්නා භික්ෂූන්ට පූජාකළ බවත් සඳහන් වේ. මෙයින් පැහැදිලිවන සත්‍යය නම් බුද්ධාගමෙහි දෙවෙනි ශාඛාව වූ මහායානයට කලසන් නැමති ගමෙහි වූ ආරාමය අයිතිව පැවති බවය.

කලසන් ශිලාලෙඛනයෙහි සඳහන්වන තවත් සැලකිය යුතු කාරණයක් වෙයි. තාරාදේවියට පූජාකළ ඒ ආරාමය සාදවන ලද්දේ කිසියම්

රජෙකු විසිනි. ඔහුගේ නම එහි සඳහන් නොවේ. නමුත් ඔහු ශෛලෙන්ද්‍ර වංශයට ආභරණයක් වැනි යයි එහි සඳහන් වේ. මේ ශිලාලේඛනය ප්‍රසිද්ධ කළ කාලයෙහි මෙහි සඳහන් ශෛලෙන්ද්‍ර වංශය ගැන කිසි තොරතුරක් දැනගන්නට නොහැකිවිය. නමුත් ඊටපසු සොයාගන්නා ලද ශිලාලේඛනවල මේ අප්‍රකට රාජවංශය ගැන වැඩිපුර යමක් දැන ගැනීමට හැකිවිය. දැනට සොයාගෙන තිබෙන හැටියට ශෛලෙන්ද්‍ර වංශිකයෝ සුමාත්‍රා – ජාවා – මලයා අර්ධද්වීපය යන මෙයින් යුක්ත වූ ශ්‍රී විජය රාජ්‍යයෙහි පාලකයෝවූහ. එසේ ම ඔවුන් භක්තිමත් බෞද්ධයෝද වූහ. ඔවුහු ඔවුන් ගේ රාජ්‍යයෙහි පමණක් නොව අන්‍ය රාජ්‍යයන්හිද බෞද්ධ ආරාමයන් ගොඩ නැගූහ. දකුණු බිහාරයෙහි පිහිටි ප්‍රසිද්ධ බෞද්ධවිද්‍යා පීඨය වූ නාලන්දවෙහි ද කොර මණ්ඩල වෙරළෙහි වූ නාගපට්ටන වෙහි ද ඔවුන් විසින් බෞද්ධ සිද්ධස්ථානයෝ ගොඩ නංවන ලදහ.

ජාවාරටෙහි ඉතාවිශාල වූ ලොක ප්‍රසිද්ධ බොරෝ බුදූර් චෛත්‍යය ද ශෛලෙන්ද්‍ර වංශික රජුන් විසින් ගොඩ නංවන ලද ඉතාවිශාල බෞද්ධ ස්මාරකයකි. ඔවුන්ගේ භක්තිය පිඩු වූවාක් මෙන් බබලන මේ චෛත්‍යයාගේ ගොඩ නැගීම පිළිබඳ සැලකිය යුතු විස්තරයක් තවම සොයා ගෙන නැත. එහෙත් ඉතිහාසඥයන්ගේ අදහස් අනුව මේ ප්‍රසිද්ධ චෛත්‍යය ගොඩනගන ලද්දේ ක්‍රි:ව: 8 වන සියවසේ දෙවන භාගයේදීය. එකල ජාවාරට ශෛලෙන්ද්‍ර වංශික රජුන්ගේ බලයට යටත්ව පැවති බවද පැහැදිලිය.

බොරෝ බුදූර් අලංකාරයෙන් හා නිර්මාණයෙන් ඔප්නැගුණු චෛත්‍යරාජයෙකි. එසේම ලොකයෙහි අසහාය චෛත්‍යයද එයවේ. එහි සැලැස්ම හෙවත් මූලාදර්ශය ඉන්දියාවේ සාමාන්‍ය චෛත්‍යය කින් ගන්නා ලදැයි පුරාවිද්‍යාඥයෝ කියති. විශාල ගිනි කඳුවලින් යුත් 'කෙබු' නැමති සාරවත් තැනිතලාවේ මැද පිහිටි කන්දක් මත මේ චෛත්‍යය ගොඩනගා ඇත්තේය. ඒ අවට ඇති ස්වභාවික දර්ශනයද මේ චෛත්‍යයාගේ කාන්තිය දියුණු කරන සුලුය.

මේ මුලු ජම්බාරයම ඔසවා තිබෙන්නේ විශාල අඩිතාලමක් මතුපිටය. මේ චෛත්‍යය මුලදී මෙතරම් විශාල නොවූ බවත් පසුකාලයෙහි එය විශාල කරන ලද බවත් කියනු ලැබේ. මේ චෛත්‍යරාජයා ගොඩනගන අතර මෙහි යොධතලච්ච කිඳාබසින්නට පටන් ගත්බව පෙනේ. මේ සිද්ධිය නිසා නිර්මාණශිල්පීන් විසින් ගල් දැමීමෙන් මුල් අත්තිවාරම ශක්තිමත් කරන ලදී.

බොරෝ බුදූර් චෛත්‍යයාගේ බඳ පිළිවෙළින් තැනූ තට්ටු නමයකින් යුක්තය. එයින් සයක් පහත් තට්ටුය. ඒවා හතරැස්‍ය. මේ චෛත්‍යයාගේ මුදුනට නැගීමට පඩිපෙලවල් 4 ක් ඇත. මේවා පටන් ගන්නේ හතරැස් අඩිතාලමේ සතර පැත්තේ මැදසිටය. තවද මේ සතරැස් තට්ටු කැටයමින් අලංකාර කළ දෙරටු සතරකින්, යුක්තය. මෙහි සිත්ගන්නාසුලු ප්‍රධාන කලා කෘතියනම් මකර තොරණය. සතරැස් තට්ටු සතර විසිතුරු ගල් පවුරකින් වටකරන ලද්දේය. චෛත්‍යය ප්‍රදක්ෂිණා කරනු පිණිස විවෘත්තවූ විල් සතරක්ද ඇත. ඒවා කැටයමින් යුත් ගල් ගරාදි වැටවලින් වට කොට ඇත. චෛත්‍යය වටා බුදුන්ගේ ප්‍රමාණයට ගලින් නෙලනලද, පද්මාසනස්ථ බුද්ධ ප්‍රතිමා ඇත. ඒ සෑම බුද්ධ ප්‍රතිමාවකම මුද්‍රාකළ අහිලි ඇත්තේ ය.

බොරෝ බුදූර් චෛත්‍යයාගේ ඉදිරිපස වර්ග සතරකට අයත් බුද්ධ ප්‍රතිමා තබා ඇත. සෑම පිළිමයක්ම වෙනස් වන්නේ මුද්‍රාවලිනි. මේ පිළිම සතර මහායාන බුද්ධාගමෙහි ප්‍රසිද්ධ ධ්‍යානි බුදුවරුන්ගේ පිළිම වශයෙන් සලකනු ලැබේ. මොවුහු සතර දිගට අධිපතීන් ලෙසද සලකනු ලැබෙත්. නැගෙනහිරට අක්ෂොභය බුදුන්ය. භූමිස්පර්ශ මුද්‍රාව එතුමන්ට අයත්ය. දකුණු දිගට රත්න සම්භව බුදුන් ය. වරද මුද්‍රාව එතුමන්ට අයත්ය. බස්නාහිරට අමිතාභය බුදුන්ය. ධ්‍යානි මුද්‍රාව එතුමන්ට අයත් ය. එතුමා නිතරම ධ්‍යානයෙහි සමවැදී සිටී. උතුරට අමොඝසිද්ධ බුදුන් ය. අභය මුද්‍රාව එතුමන්ට අයත්ය. මේ සෑම මුද්‍රාවක්ම අත් ඇඟිලිවලින් දක්වා ඇත. මේ සතර ධ්‍යානි බුදුවරුන්ට පරිවාර වශයෙන් දෙයානුවක් බුද්ධ ප්‍රතිමා ඇත්තේ ය. මෙයට උඩින් මාලයෙහි බුද්ධ ප්‍රතිමා සූසැටක් ඇත. මේ සෑම පිළිමයක්ම විතර්ක මුද්‍රාවෙන් යුක්තය. වෛරොචන බුදුන්ගේ ප්‍රතිමාව පස්වෙනි ධ්‍යානි බුද්ධ ප්‍රතිමාව වශයෙන් තබා ඇත. ද්වාරමුඛයන්හි ඇති සියලුම බුද්ධ රූප 108 කි. මේ ගණන ඉන්දියාවෙහි මෙන් ජාවාරටෙහිද ශුභ සංඛ්‍යාවක් වශයෙන් සැලකූ බව මෙයින් පෙනේ. මේ චෛත්‍යය වටේ ඇති කුඩා ප්‍රතිමා දෙසැත්තෑවකි. මේ චෛත්‍යය වැනි නිර්මාණයක් බෞද්ධ ලෝකයෙහි කොතැනකවත් දක්නට නොලැබේ. මෙහි ප්‍රධාන ද්වාර මුඛයෙහි ඇති සවෙනි බුද්ධ රූපය වජ්‍රසත්ත්ව නැමති ධ්‍යානි බුදුන්ගේ ප්‍රතිමාවය.

කැටයම් ශිල්පය අතින් බොරෝ බුදූර්හි වටිනාකම ප්‍රමාණය කළ නොහැකිය. ශොභාවෙන් හා කලාව අතින් එය පැරදවීමට චෛත්‍යයක් මුලු අශියාවේම නැත. චෛත්‍යය වටා ඇති ප්‍රාකාරය හා ගල්වැට කැටයම් කළ ගල්ලෑලිවලින් යුක්තය. එවැනි ගල්ලෑලි 1500 ක් යොද ඇති බවද ඒවා එකිනෙකට ගැටෙන සේ පෙලට

තැබුවහොත් සැතපුම් තුනක් පමණ වෙතිද කියනු ලැබේ. මෙහි ඇති වටිනා කම් කැටයම් පිළිබඳ සෞන්දර්ය වටිනා කමයි. මේ ප්‍රතිමාවන් නෙලූ ශිල්පීහු ගල්වලින් මනුෂ්‍ය රූපනෙලීමේ තමන්ට ඇති නිපුණත්වය මනාව විදහා පාති. මෙහි කැටයම් කොට ඇති බුද්ධ චරිතය හා ජාතක පුදුම එලවන සුලුය. ඒවා ගන්නා ලද්දේ මහායානයෙහි ප්‍රචලිත ලලිතවිස්තර, අවදන හා ජාතක මාලා යන ග්‍රන්ථයන්ගෙනි. බුදුන් හා සම්බන්ධ නොයෙක් නොයෙක් කථාන්තර හා බොධිසත්ව වෘතාන්තද මෙහි කැටයම් කොට ඇත. බොධි සත්ත්වයන් අතර බොධි සත්ත්ව සූධන, මඤ්ජුශ්‍රී, මෛත්‍රෙය, සමන්ත භද්‍ර යන අය ප්‍රධාන වෙත්. මේ චෛත්‍යයෙහි ඇති කැටයම් ශිල්ප ඉන්දියාවෙහි ඇති කැටයම් වලට වඩා හාත්පසින්ම වෙනස්ය. මෙතරම් සවිස්තරව බුද්ධචරිතය, බුද්ධ ධර්මය හා බොධි සත්ත්ව චරිත නිරූපණය කළ අන් චෛත්‍යයක් ලොව නැත. මලයාවට ඉස්ලාම් ආගම පැමිණීමෙන් පසු එහි බෞද්ධවන්දනා පිරිහෙන්නට පටන් ගත්තේය. එයින් පසු බොරෝ බුදූර් චෛත්‍යයද ගරා වැටෙන්නට පටන් ගති.

බොරෝ බුදූර් චෛත්‍යය හැරෙන්නට ජාවා රටෙහි තන්හි තන්හි කුඩා චෛත්‍යය බොහෝ ගණනක් ඇත. ඒවා කැටයම් ශිල්පය, ප්‍රතිමා ශිල්පය හා වාස්‍යවිද්‍යාව අතින් ඉතා වැදගත්ය. බොරෝ බුදූර් චෛත්‍යයට සැතපුම් කීපයක් දුරින් බෞද්ධ සිද්ධස්ථාන දෙකක් ඇත. ඒවා මහා චෛත්‍යය හා සම්බන්ධවූ සිද්ධස්ථාන වශයෙන් සලකනු ලැබේ. එසේම සමකාලිකද වියහැකිය. එයින් විශාල ආරාමය 'චණ්ඩිමෙග්ඩම්' නමින්ද, කුඩා ආරාමය 'චණ්ඩිපටන්' නමින් ද හඳුන්වනු ලැබේ. මෙහි ඇති චෛත්‍යය වටා බුද්ධරූප හා බොධිසත්ත්ව රූප නෙලා ඇත.

හින්දු යුගයට අයත් චෛත්‍ය තුනක් ප්‍රම්බැනස් නැමති ගමෙහි තිබී සොයාගෙන තිබේ. මේ ආරාම තුන බ්‍රහ්ම – විෂ්ණු – මහෙශ්වර යන හින්දු දෙවිවරුන්ට පූජාකොට ඇත. බුදු සමයට අයත් සිද්ධස්ථාන ද මේ ගමෙහි තිබී සොයාගෙන තිබේ. සංස්කෘත ශිලාලිපියක ශෛලෙන්ද්‍ර රජවරුන් විසින් තාරාදේවිය උදෙසා මේ ආරාමය කළ බව සඳහන් වේ. ඒ ආරාම 'චණ්ඩිසරි' සහ 'චණ්ඩිසිවි' යන නම් වලින් හිඳුන්වනු ලැබේ. ජාවාරටෙහි බෞද්ධ කලාශිල්ප කොතරම් ඔජ්නැගී තිබුනේද යනු පූර්වොක්ත කරුණුවලින් ප්‍රකට වේ.